)වීශේදීඞ් ශෙදවීලු!දි ටීඞීරීමීවී
All Rights Reserved

| |
|---|
| **අවසාන වාර පරීක්ෂණය 2015** |
| 7 ශ්‍රේණිය |
| **සිංහල භාෂාව හා සාහිත්‍යය** |
| කාලය පැය 02 යි. |
| නම/ විභාග අංකය : ........................................................................................ |

- යටින් ඉරි ඇඳි කොටසට වඩාත් ගැළපෙන යෙදුම තෝරන්න.

01 තමා මංජු සමග කිසිම <u>ඇයි හොඳයියක්</u> නැති බව ජගත් පැවසුවේ ය.

(1) බහින් බස් වීමක් (2) අමනාපයක්

(3) ගනුදෙනුවක් (4) මිතුරුකමක්

- පහත දැක්වෙන එක් එක් පද පේළිවල වැරදි අක්ෂර වින්‍යාසය සහිත පදය තෝරන්න.

02 (1) වර්ථමාන (2) විශිෂ්ට (3) ආශ්චර්යමත් (4) ශෛලමය

03 (1) සෞන්දර්යය (2) ඓතිහාසික (3) විශ්මය (4) පරිගණක

- පහත දී ඇති කියමනට ගැලපෙන ප්‍රස්තාව පිරුළ තෝරන්න.

04 ප්‍රයෝජන ලබාදෙන තැනැත්තා ළඟ ඉඳගෙන ඔහුටම විරුද්ධ ව ක්‍රියා කිරීම

(1) අඟේ ඉඳන් කන කනව වගෙයි (2) දත් නැති දා උක් දඬු ගිනි තපින්න ද

(3) දාහට අරන් පන්සීයට දුන්නා වගෙයි (4) අටුවෙන් දුමට බැස්සා වගේ

- මෙම යෙදුමට ගැලපෙන තනි පදය ලියන්න.

05 නොයෙක් රටවල සංචාරය කිරීම

(1) ප්‍රවාහනය (2) ආගමනය (3) දේශාටනය (4) සංක්‍රමණය

06 මහවැලි ගඟ, ගව රැළ, පුවත්පත, රතුමල යන නාම අයත් නිවැරදි පිළිවෙළ වන්නේ,

(1) ජාතිනාම, ද්‍රව්‍යනාම, ගුණනාම, සංඥානාම

(2) සර්වනාම, ද්‍රව්‍යනාම, සංඥානාම, ජාතිනාම

(3) සංඥානාම, ජාතිනාම, ද්‍රව්‍යනාම, ගුණනාම

(4) ජාතිනාම, සර්වනාම, ක්‍රියානාම, සංඥානාම

07 මහාප්‍රාණ අක්ෂරයක් නැති වචනය වන්නේ,

(1) විශේෂ (2) ධර්මය (3) ලේඛකයා (4) නිර්භය

08 කුඩා දරුවන් දක <u>ප්‍රීතියෙන්</u> සිනාසෙයි. මෙහි ඉරි ඇඳි පදය

(1) උක්ත විශේෂණයකි. (2) නාම විශේෂණයකි.

(3) ක්‍රියා විශේෂණයකි. (4) උපමාවකි.

09 රකාරාංශය, යංශය, රේපය, ගයනුකිත්ත පිළිවෙළින් දක්වෙන වචන පේළිය තෝරන්න.

(1) කර්මය, වික්‍රමය, ඖෂධ, නාට්‍යය

(2) යන්ත්‍රය, අධ්‍යාපනය, ධර්මය, කෞතුකාගාරය

(3) බෞද්ධ, චිත්‍රය, වර්ධනය, භාග්‍යය

(4) සූත්‍රය, වර්ගය, සංඛ්‍යාව, පෞද්ගලික

10 යුගල පදයක් නොවන පිළිතුර තෝරන්න.

(1) සිරිත් විරිත් (2) වගතුග (3) දුගී මගී (4) කරදර

11 අක්කා ගී <u>ගයමින්</u> මල් නෙලන්නීය. ඉරි ඇඳි පදය අයත් ක්‍රියා පද වර්ගය

(1) පූර්ව ක්‍රියා (2) විධි ක්‍රියා (3) මිශ්‍ර ක්‍රියා (4) අවසාන ක්‍රියා

12 නාමයක් කෙටි කර දක්වීමේ දී යොදනු ලබන විරාම ලකුණ වන්නේ,

(1) කොමාව (2) තිත (3) කෙටි ඉර (4) හර්ෂාදී ලකුණ

- යටින් ඉරි ඇඳි පදයේ අර්ථය දෙන පිළිතුර තෝරන්න.

13 රුමත් කුමරිය <u>රජතමය</u> ආභරණ වලින් සැරසුණා ය.

(1) රනින් කළ (2) කැටයම් කළ (3) මිළ වැඩි (4) රිදියෙන් කළ

14 ගංවතුර නිසා ගම් වැසියෝ <u>අනපේක්ෂිත</u> සිදුවීම්වලට මුහුණ දුන්හ.

(1) නිසරු (2) අස්ථිර (3) බලාපොරොත්තු නොවූ (4) අවස්ථාවාදී

15 පහත සඳහන් වාක්‍යයෙහි යටින් ඉරි ඇඳි පද අයත් පුරුෂය සහ කාලය නිවැරදිව දක්වෙන වරණය තෝරන්න.

<u>මම</u> පන්සල් <u>ගියෙමි</u>.

(1) උත්තම පුරුෂ, අතීත (2) මධ්‍යම පුරුෂ, අනතීත

(3) ප්‍රථම පුරුෂ, අතීත (4) උත්තම පුරුෂ, අනතීත

- 16 සිට 20 දක්වා වූ වාක්‍යවල හිස්තැනට ගැලපෙන පදය තෝරන්න.

16 අලුයම අවදි වී පාඩම් කිරීමට ............................................... පුරුදු වූහ.

(1) ඔවුන් (2) ඔවුහු (3) ඔහු (4) ළමයින්

17 ඉර පායන විට වැව්වල නෙළුම් මල් විකසිත ........................................................

(1) විය (2) වෙති (3) වූහ (4) වෙන ලදී

18 අම්මා සමග මම මිදුල පිරිසිදු ..................................................

(1) කළාය (2) කළෙමි (3) කළෙමු (4) කළෝය

19 ........................................... අප සමග වෙසක් බැලීමට එන්නෙහු.

(1) තෝ (2) ඔවුන් (3) මිතුරන් (4) නුඹලා

20 ශිෂ්‍ය ශිෂ්‍යාවන් රැගත් බස් රථ කිහිපයක් අනුරාධපුරය බලා පිටත් ............................................

(1) විය (2) වූහ (3) වෙති (4) වුණෝය

(2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්නය, දෙවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න තුනක් ඇතුළුව ප්‍රශ්න 5 කට පිළිතුරු සපයන්න.**

01 විද්‍යාත්මක දැනුම සෙවීම පිළිබඳව පංති කාමරය තුළ කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු සපයන්න.

(1) ඔබ කණ්ඩායම විසින් සකස් කරන ලද පොත් පිංචෙහි නම සඳහන් කරන්න. (ල. 02)

(2) තොරතුරු සෙවූ විද්‍යාඥයින් හතරදෙනෙක් නම් කරන්න. (ල. 04)

(3) මෙම නිර්මාණය තුළින් ඔබ ලබාගත් ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න. (ල. 03)

(4) ඔබ කණ්ඩායම තොරතුරු සොයාගත් මාර්ග තුනක් සඳහන් කරන්න. (ල. 03)

(5) කණ්ඩායම් ක්‍රියාකාරකම කිරීමේ දී ඔබ මුහුණපාන ගැටළු 4 ක් සඳහන් කරන්න. (ල. 04)

02 පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 150 ක පමණ රචනයක් ලියන්න.

(1) දිය ඇල්ලයි සිරියාවයි
(2) මා වෛද්‍යවරයකු වුවහොත්
(3) ගුණ දම් සුරකිමු
(4) මා ඉපදුණු රට අගේය
(5) සිංහල ජන කවිය (ල. 14)

03 ''නාගහවත්ත'' ග්‍රාමයේ ''පැරකුම්'' ග්‍රාමීය සංවර්ධන සමිතියේ ලේකම් ඔබ යයි සිතා ගම හරහා දිවෙන මහා මාර්ගය අබලන්ව තිබෙන බැවින් ඒ මතින් දිවෙන වාහන නිතර අබලන් වන බවත්, ජනතාවට අසීරුතාවලට මුහුණ පෑමට සිදුවන බවත් විස්තර කරමින් ඔබ පළාතේ මහා මාර්ග ඇමතිතුමාට යැවීම සඳහා ලිපියක් පිළියෙළ කරන්න. (ල. 10)

04 ''අපේ මැණියෝ නැති වෙලා දැන් කොච්චර කල් ද?''

(1) මෙම ප්‍රකාශය කළේ කවරෙක් ද?

(2) කවර අවස්ථාවේ ද?

(3) මෙය උපුටාගෙන ඇත්තේ කුමකින් ද?

(4) එම නිර්මාණය කළේ කවරෙක් ද?

(5) ඔහුගේ වෙනත් නිර්මාණ දෙකක් ලියන්න. (2 x 5 = 10)

05 පොහොසද්දන ඇති තුණුරුවන බැති පෙමා
මුළු වද්දන සුර පුර පිරි සිරින් හැමා
ජයවද්දන කැරුමෙන් සුසැදි තම නමා
ජයවද්දන පුරවර දනු මිතුරු තුමා

සැදි රත තඹර පෙළ රන තිසරුන් රුවැති
විදි දිය දහර ලෙළ දෙන දිගු තරු පටැති
රැළි රළ රළැති හොය දියවන්නා නැමති
ඇදි පුර අඟන පට සළු සිරි රුවැයි නිති

(1) පද්‍යවල සඳහන් ආකාරයට සැළලිහිණියා යා යුතු නගරය කුමක් ද? (ල. 02)

(2) මෙහි පළමු කවියේ තේරුම ලියන්න. (ල. 04)

(3) මෙහි සඳහන් ආකාරයට දියවන්නා ඔය උපමා කර ඇත්තේ කුමකට ද? (ල. 02)

(4) නගරය, රතු නෙළුම්, රන හංසයින්, දිය රැළි යන පදවල අර්ථය දැක්වෙන පද පද්‍ය පන්තියෙන් තෝරා ලියන්න. (ල. 02)

06 පහත සඳහන් ගීතය ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

වැසි වසිනා අහස අපි

මුතු බඳිනා මුහුද අපි

මිණි දිලෙනා පොළව අපි

සිරි ලංකා රටම අපි

අපේ පැතුම් අහසට විහිදී යයි

කම්හල්වල දුම් වළලු දිගේ

අපේම දහදිය මුහුද බලා යයි

ගං හෝ ඇළ දොළ කඳුරු වගේ

දෙරණ පළා රතු කැට මතුවන්නට

ඔබ අත දෙන තුරු බලා හිඳී

ගොවියෝ අපි කම්කරුවෝ

රට රකිනා ජනතාවෝ

ගතවැකි දුහුවිලි මිණි බරණයි

දහදිය වත් විලවුන් සුවඳයි

රට වෙනුවෙන් ගත සිත වෙහෙසයි

සිත සතුටේ උල්පත එතනයි

ගොවියෝ අපි කම්කරුවෝ

රට රකිනා ජනතාවෝ

(1) මෙම ගීතයෙන් කියැවෙන්නේ කුමක් ද?

(2) කම්කරු ශ්‍රමයෙන් කර්මාන්ත දියුණු වන බව ප්‍රකාශ වන ගීත පාද දෙක උපුටා දක්වන්න.

(3) ''දෙරණ පළා රතු කැට මතුවන්නට

ඔබ අත දෙන තුරු බලා හිඳී'' මෙහි අදහස ලියන්න.

(4) මෙහි ඇති යුගල පද දෙකක් උපුටා දක්වන්න.

(5) පහත සඳහන් වචනවල අරුත් ලියන්න.

1. හෝ 2. ගත වැකි

(2 x 5 = 10)